**පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (මධ්‍යම හා සබරගමුව පළාත්) - 2014**

---

පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (මධ්‍යම හා සබරගමුව පළාත් ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්- පී96 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (මධ්‍යම හා සබරගමුව පළාත්) ණය ගිවිසුම අනුව,එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මධ්‍යම හා සබරගමුව පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම, වැඩි දියුණු කිරීම හා මාර්ග නියෝජිතායතන හා කොන්ත්‍රාත්කරුවන්ගේ ආයතනික ධාරිතාවයන් ශක්තිමත් කිරීම මගින් විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩි කිරීම හා විශ්වාසය ඇතිකරලීම සහ එමගින් දේශීය ආර්ථික සංවර්ධනයට දායක වීම හා ප්‍රාදේශීය අසමානතා අඩුකිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 11,171 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 9,156 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2014 ජනවාරි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 මාර්තු 25 දක්වා දීර්ඝ කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල

දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ඉස්මතු කොට පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1** **මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

( අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ඉස්මතු කොට පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 9,156.00 | 11,628.00 | 4,428.70 | 3,610.64 | 4,274.52 | 7,416.46 | 9,500.90 |
| ශ්‍රී ලං ර | 2,015.00 | 2,559.00 | 523.00 | 477.04 | 519.64 | 941.03 | 1,136.00 |
| එකතුව | 11,171.00 | 14,187.00 | 4,951.70 | 4,087.68 | 4,794.16 | 8,357.49 | 10,636.90 |

### 3.2 භෞතික ප්‍රගතිය

මධ්‍යම හා සබරගමුව පළාත් මාර්ගවල කිලෝමීටර් 300.97 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා අදියර 02 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් සිදු කර තිබුණි. පැකේජ 39 ක් යටතේ කොන්ත්‍රාත්තු ලබා දී තිබූ අතර ඉන් කොන්ත්‍රාත් පැකේජ 34 ක් යටතේ එම මාර්ග කිලෝමීටර් 261.19 ක් පුනරුත්ථාපනය කිරීම 2015 ජූනි 30 දිනට නිම කර තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාතේ මාර්ග 07 ක පුනරුත්ථාපන වැඩ දින 102 සිට දින 547 දක්වා වූ ප්‍රමාදයන් සහිතව නිම කර තිබූ අතර එකතුව රු. මිලියන 83.60 ක ප්‍රමාද ගාස්තු ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයට නිම නොකරන ලද කොන්ත්‍රාත් පැකේජ 05 ක් යටතේ සබරගමුව පළාතේ මාර්ග පුනරුත්ථාපනය පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ගය | දිග කි.මී. | නිම කිරීම සඳහා අපේක්ෂිත දිනය | 2015 ජූනි 30 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| | | | % |
| මාබෝපිටිය පාරඹේ වතු මාර්ගය | 8.20 | 2015 ජනවාරි 29 | 98 |
| අන්නාසිගල - බෝලගම - පත්තම්පිටිය මාර්ගය | 9.17 | 2014 නොවැ.28 | 89 |
| කොටමුල්ල - කරන්ගොඩ - දිමියාව මාර්ගය | 7.00 | 2014 අප්‍රේල් 27 | 81 |
| අරණායක - අම්බලකන්ද - කැළේ මාර්ගය | 10.41 | 2014 ජූනි 17 | 73 |
| මාවෙල - වෙලන්ගහ - රුක්අත්තන මාර්ගය | 5.00 | 2015 පෙබරවාරි 03 | 46 |

තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සබරගමුව පළාත් සභාවේ මාවෙල - වෙලන්ගහ - රුක්අත්තන මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2015 ජූනි 30 දිනට සියයට 46 ක අඩු ප්‍රගතියක් වාර්තා කර තිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු. මිලියන 16.21 ක් වූ මුළු අත්තිකාරමෙන් කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය අවසානයට රු. මිලියන 13.13 ක මුදලක් පමණක් අය කර ගෙන තිබුණි.

(ii) එයට අමතරව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසාන දිනයට අනෙක් මාර්ග 04 ක පුනරුත්ථාපන වැඩ පිළිබඳ භෞතික ප්‍රගතිය සියයට 73 සිට සියයට 98 දක්වා වූ අඩු ප්‍රගතියක් දක්වා තිබුණි. එම මාර්ගවල ඉතිරි පුනරුත්ථාපන වැඩ ශ්‍රී ලංකා රජයෙන් සපයන ලද අරමුදල් වලින් නිම කිරීමට සිදුවන බව එය සාක්ෂි දරයි.

(ඇ) රු. මිලියන 136.95 ක පිරිවැයකට මාර්ග නඩත්තු කිරීමේ උපකරණ ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර සබරගමුව පළාත් සභාවේ ඉදිකිරීම් සංවර්ධන යන්ත්‍රෝපකරණ අධිකාරියට හා මධ්‍යම පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට , එම පළාත්වල මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන් අඛණ්ඩව සිදු කිරීම සඳහා භාරදී තිබුණි. කෙසේ වුවද විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල නඩත්තු වැඩ සාර්ථකව සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. පළාත් සභා මගින් අරමුදල් නොසැපයීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ මාර්ග නඩත්තු වැඩ සාර්ථකව සිදු කිරීමට නොහැකි වූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සඳහන් කර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

2014 මාර්තු 12 වන විට " මොබයිල් කෝල්ඩ් ඇස්පල්ට් ප්ලාන්ට් " (Mobile Cold Asphalt Plants) 02 ක් සැපයීමට හා සවිකිරීමට සැලසුම් කර තිබුණද, එම පිරියත 2014 අගෝස්තු මාසයේදී සපයා තිබුණි. එහෙත් සුදුසු ස්ථානයක් නොතිබීම හේතුවෙන් 2015 ජූනි 30 දක්වාත් ඒවා සවි කිරීමට පියවර ගෙන නොතිබුණි. ගුදම් ගාස්තු හා 2014 දෙසැම්බර් 26 දක්වා ඒ මත දරන

ලද පොලිය සඳහා රු. මිලියන 10.38 ක මුදලක් ව්‍යාපෘතියෙන් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා සැපයුම්කරු ඉල්ලීම් කර තිබූ බව නිරීක්ෂණය විය. තවද ප්‍රමාද වී සැපයීම හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සිදු කරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා එම යන්ත්‍රෝපකරණ භාවිතා කළ නොහැකි විය.

### 3.4 නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් මාසයේදී මධ්‍යම පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 29.82 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද "කාපට් අතුරන යන්ත්‍රය" (Asphalt Premix Paving Machine ) 2015 මැයි දක්වා අවස්ථා 05 කදී පමණක් මාර්ග වැඩ සඳහා භාවිතා කර තිබූ බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) සබරගමුව පළාතේ විධායක ඉංජිනේරු කාර්යාල 08 ක භාවිතය සඳහා ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 24.30 ක් වටිනා "ටිපර් රථ " 08 ක් හා රු. මිලියන 9.95 ක් වටිනා" ඩබල් ඩ්‍රම් ස්ටීල් වීල් රෝලර්ස් " (Double Drum Steel wheel Rollers ) 08 ක් මාර්ග නඩත්තු වැඩ සඳහා විධායක ඉංජිනේරු කාර්යාලවලට බෙදා හැරීමට කටයුතු කිරීමෙන් තොරව මාස 08 කට වැඩි කාලයක් සබරගමුව පළාත් සභාවේ ඉදිකිරීම් සංවර්ධන යන්ත්‍රෝපකරණ අධිකාරිය පරිශ්‍රයේ තබා තිබුණි. තවද 2014 වර්ෂයේදී රු. මිලියන 2.94 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද "පැතලි ලෙලෙන තලන" (Plate Compactors) 15 ක් හා තණකොළ කපන යන්ත්‍ර (Bush Cutting Machines ) 16 ක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2015 මැයි 31 වන විටත් සබරගමුව පළාත විධායක ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි.

### 3.5 පරිබාහිර ගනුදෙනු

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 5.4 වගන්තියට පටහැනිව ලබා නොගත් නිවාඩු මුදල් කිරීම් සඳහා රු.131,050 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරීන් දෙදෙනෙකුට ගෙවා තිබුණි.

(ආ) පාරිතෝෂික ගෙවීම් නිරවුල් කිරීම මාස 08 කට වැඩි කාලයක් ප්‍රමාද වීම මත රු.134,794 ක අධිභාර ගෙවා තිබුණි.